කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

**පුරවැසි අධ්‍යාපනය**

**11 ශ්‍රේණිය**

**පළමු පත්‍රය** **කාලය පැය එකයි**

**සැලකිය යුතුයි**

**(I). සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

**(II). අංක එකේ සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4, යන පිළිතුරුවලින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න**

**(III). ඔබට සැපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවිය තුළ (කතිර) * ලකුණ යොදන්න.**

---

1. මිනිසෙකු ලෙස ගරුත්වයෙන් යුතුව සමාජය ජීවත් වීම සඳහා ඔහුට උපතින්ම ලැබෙන අයිතිවාසිකම් වන්නේ

    1. මූලික අයිතිවාසිකම් වේ
    2. මානව අයිතිවාසිකම් වේ
    3. සාමාජීය අයිතිවාසිකම් වේ
    4. සිවිල් අයිතිවාසිකම් වේ

2. මැතිවරණයක දී ජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත් කර ගැනීම

    1. ජනතාවගේ වගකීමකි
    2. ඡන්දදායකයා ගේ වගකීමකි
    3. දේශපාලන පක්ෂවල වගකීමකි
    4. සිවිල් සමාජයේ වගකීමකි

3. රාජ්‍යය කැමැත්ත හා මහජන අපේක්ෂාවන් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ

    1. විධායකයයි
    2. ව්‍යවස්ථාදායකයයි
    3 ආණ්ඩුවයි
    4. අධිකරණයයි

4. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාමකාමී ජන සමාජයක් ගොඩනැගීම සඳහා හේතු වන කරුණක් අඩංගු පිළිතුර තෝරන්න

    1. සුළුතර අදහස් නොසලකා හැරීම
    2. බහුතර මතයට ගරු කිරීම
    3. පුරවැසියන්ට සිය අදහස් ප්‍රකාශ කිරීම සීමා කිරීම
    4. පාලකයන්ට අවශ්‍ය නීති සම්පාදනයට ඉඩ සැලසීම

5. ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරා දීම හැඳින්වෙන්නේ කුමන නමකින්ද

1. බලය බෙදාහැරීම නමින්
2. බලය විමධ්‍යගත කිරීම නමින්
3. බලය පවරා දීම නමින්
4. බලය විතැන් කිරීම නමිනි

6. ජාතික නිවාස හා ඉදිකිරීම් කටයුතු සිදුකිරීම .

1. පළාත් සභාවක පළාත් සභා ලැයිස්තුවට අයත් බලයකි
2. පළාත් සභාවක සංවෘත ලැයිස්තුව අයත් බලයකි
3. පළාත් සභාවක සමගාමී ලැයිස්තුවට අයත් බලයකි
4. පළාත් සභාවක පළාත් පාලන ලැයිස්තුවට අයත් බලයකි

7. මරණ දඬුවම අහෝසි කිරීම අරමුණු කොටගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් පිහිටුවා ඇති සම්මුතිය වන්නේ

1. ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය
2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පිත සම්මුතියයි
3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ අන්තර්ජාතික සම්මුතියයි
4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පිත

8. පහත සඳහන් දෑ අතුරෙන් මූලික අවශ්‍යතාවයක් වන්නේ

1. හිරු එළිය
2. ගෙවල් දොරවල්
3. ආහාර
4. ඛනිජ තෙල්

9. ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ

1. නිෂ්පාදන සම්පත් වල අයිතිය රජය සතු වීම
2. දේපළ හා සම්පත් වල අයිතිය පෞද්ගලික අංශය යටතේ පැවතීම
3. මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික කටයුතු සැලසුම් කිරීම
4. තරගකාරී බවක් දක්නට නොමැති වීම

10. දැනුම, ඇදහිලි ,කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි සංස්කෘතිය මෙලෙස විග්‍රහ කළේ

1. ඒ එල්වුඩ්.
2. ටී බී. ටයිලර්.
3.. සීලර්.
4. හැරල්ඩ් ජේ ලැස්කි

11. යහපාලනය යන්න පිළිබඳව දැක්වෙන නිවැරදි වගන්තිය මින් කුමක්ද

1. අනවශ්‍ය ආකාරයට බලය මධ්‍යගත වූ පාලනයකි
2. විනිවිදභාවයෙන් නිලධාරිවාදය ක්‍රියාවට නංවන්නකි
3. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි
4. නීතිගරුකව වගවීමෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලියකි

12 ලෝකයම එකම භාෂාවක් කතා කරන එකම මුදල් ඒකකයක් භාවිතා කරන තනි ජාතියක් බවට පත් විය යුතු බව පෙන්වා දෙන්නේ

1. සාර්ක් සංවිධානයයි
2. යුරෝපා සංගමයයි
3. එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
4. ලෝක බැංකුවයි

13 සියලුම අවශ්‍යතා හා උවමනාවන් ඉටු කිරීමට නොහැකි නිසාම මුලින්ම තීරණය කළ යුත්තේ

1. කොපමණ නිෂ්පාදනය කරන්නේද යන්නයි
2. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්නයි
3. කාහට නිෂ්පාදනය කරන්නේ ද යන්නයි
4. කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන්නයි

14. මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන් පත් කරනු ලබන්නේ

1. ජනාධිපති විසිනි
2. අගමැති විසිනි
3. අග්‍ර විනිශ්චකාරවරයා විසිනි
4. කැබිනට් මණ්ඩලය විසිනි

15. මානව හිමිකම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න

1. මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ලැබෙන සමාජයක මිනිස් ජීවිත සුරක්ෂිතව පවත්වාගෙන යාම දුෂ්කර වේ
2. ජාතිය, ආගම, භාෂාව සහ දරන දේශපාලන මතය ආදිය සලකා පොදුවේ සැමට හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වෙයි
3. සෑම මානව අයිතිවාසිකමක් ම මූලික අයිතිවාසිකමක් වේ
4. අයිතිවාසිකම් විශ්වීය සංකල්පයක් වන අතර එය සාධාරණත්වය හා සමානාත්මතාව මූලධර්මය මත පදනම් වේ

. 16. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් දැකිය හැකි රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න

1. ඉන්දියාව, ඇමරිකාව
2. ඉන්දියාව, ශ්‍රී ලංකාව
3. ශ්‍රී ලංකාව , ඇමරිකාව
4. ඇමරිකාව, ජපානය

17. 1978. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුළුව අමාත්‍ය මණ්ඩලය

1. හතර දෙනෙකුගෙන් සමන්විතය
2. පස් දෙනෙකුගෙන් සමන්විතය
3. හය. දෙනෙකුගෙන් සමන්විතය
4. හත් දෙනෙකුගෙන් සමන්විතය

18. පුද්ගලයා තුල , පුද්ගලයන් අතර ,පවුල් තුළ, පවුල අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ

1. සාර්ව ගැටුම් ලෙසය
2. පවුල් ගැටුම් ලෙසය
3. සූක්ෂම ගැටුම් ලෙස ය
4. පුද්ගල ගැටුම් ලෙසය

19. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු විසින් වර්ධනය කරගත යුතු පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න

1. අන් අයට ගරු කිරීම, අන් මතවලට ගරු කිරීම, සාධාරණත්වය
2. දරාගැනීමේ ශක්තිය ,පරිත්‍යාගශීලී බව ,සහානුභූතිය
3. ඵලදායි සන්නිවේදනය නිර්මාණාත්මක චින්තනය සවන්දීම
4. ආත්මාවබෝධය,ඉවසීම,දරාගැනීමෙ ශක්තිය

20. ශ්‍රී ලාංකිකයන්ට දේශපාලනයට මැදිහත් වීමට වැඩි අවස්ථා ලබා දුන් ආණ්ඩුක්රම ප්‍රතිසංස්කරණය කුමක්ද

1. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
2. මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
3. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

21. විධායක හා පරිපාලන ක්‍රියා නිසා පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ සොයා බැලීමට පත් කර ඇති තනතුර හඳුන්වන්නෙ කුමන නමකින්ද?

1. ඔම්බුඩ්ස්මන්වරයා
2. අගවිනිසුරු
3. කතානායක
4. නීතිපති

22. ගැටුම් නිරාකරණය කිරීමේ අපේක්ෂාවෙන් පාර්ශවකරුවන්ගේ කැමැත්ත මත තීරණය ක්‍රියාවට නැංවීම හඳුන්වන සංකල්පය කුමක්ද?

1. බේරුම් කිරීම
2. කේවල් කිරීම
3. විනිසීම
4. මැදිහත්කරණය

23 රාජ්‍යයකින් ජන සමාජයට ඉටුවිය යුතු වගකීමක් වන්නේ මින් කවරක්ද

1. රටේ සම්පත් සාධාරණව බෙදී යන සේ කටයුතු කිරීම
2. දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් බිහිකිරීම
3. වංචා දූෂණ වලින් යුතු සමාජයක් බිහි කිරීම
4. යහපාලනයක් ගොඩ නැගෙන සේ කටයුතු කිරීම

24 ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ

1.. රාජ සභාව　　2. පුරවැසි සභාව
3. මන්ත්‍රී සභාව　　4. සෙනෙට් සභාව

25. තොරතුරු දැනගැනීමේ අයිතියට අනුව ජනමාධ්‍ය ජනතාව වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේදී
1. නිදහස්ව කටයුතු කිරීම අනිවාර්යය වේ
2. අපක්ෂපාතීව කටයුතු කිරීම අනිවාර්යය වේ
3. නිදහස හා අපක්ෂපාතීව කටයුතු කිරීම අනිවාර්යය වේ
4. සත්‍ය තොරතුරු වගකීමකින් තොරව වුවද සැපයීම අනිවාර්ය වේ

26 සංවර්ධනය කරා යන ගමනේදී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකරගැනීම හඳුන්වන්නේව

1. සදාචාර සංවර්ධනය ලෙසය
2. සමාජ සංවර්ධනය ලෙසය
3. තිරසාර සංවර්ධනය ලෙසය
4. සංස්කෘතික සංවර්ධනය ලෙසය

27. . තීන්දු ගැනීමේ ක්‍රියාවලියේදී සියලු දෙනාම සම්බන්ධ වන්නේ නම් එය හැඳින්විය හැක්කේ

1. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
3. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය
4. සාමූහික ප්‍රජාතන්ත්‍රවාදය

28. පුරවැසි යුතුකම් පිළිබඳ අවබෝධයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ
(1). 26 වන ව්‍යවස්ථාවේ සඳහන්ය
(2). 27 වන ව්‍යවස්ථාවේ සඳහන්ය
(3). 28 වන ව්‍යවස්ථාවේ සඳහන්ය
(4). 30 වන ව්‍යවස්ථාවේ සඳහන්ය

29. ''රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමත්, ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ.'' මෙය කාගේ කියමනක්ද?

1. එඩ්ගාකේසි
2. සීලර්
3. ඒබ්‍රහම් ලින්කන්
4. මහාචාර්ය ගානර්

30. ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා සංවිධානය වූ පුද්ගල කණ්ඩායමක් අප හඳුන්වන්නේ

1. දේශපාලන පක්ෂයක් ලෙසය
2. විපක්ෂය ලෙසය
3. ආණ්ඩුව ලෙසය
4. රාජ්‍ය ලෙසය

31. ශ්‍රී ලංකා මැතිවරණයකදී එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා තරග කරන අපේක්ෂකයින්ගෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයා ජයග්‍රහකයා ලෙස පත්වන ක්‍රමය අප හඳුන්වන්නේ

1. මහ මැතිවරණය නමින්
2. සමානුපාතික නියෝජන ක්‍රමය ලෙසින්
3. මහජන නියෝජිත ක්‍රමය ලෙසින්
4. සරල බහුතර නියෝජන ක්‍රමය ලෙසින්

32. 1863. වහල් සේවයේ යොදවා සිටි මිනිසුන් නිදහස් කර ඔවුන්ගේ සමාජ සුරක්ෂිතතාවය තහවුරු කළ පූර්වාදර්ශ ඇමරිකානු නායකයකු ලෙස හඳුන්වන්නේ,

1. විලියම් ශේෂ්පියර්
2. ඒබ්‍රහම් ලින්කන්
3. ඒබ්‍රහම් විලියම්
4. තෝමස් අල්වා එඩිසන්

33. තාක්ෂණික මෙවලම් භාවිතය නිසා මිනිසා කෙරෙහි බලපා ඇති අහිතකර බලපෑමක් වනුයේ

1. පරිසරය දූෂණය වේගවත්වීම
2. සම්පත් නාස්තිය අවම වීම
3. සමාජ සබඳතා තහවුරු වීමය
4. ඵලදායිතාවය ඉහළ මට්ටමක පැවතීම

34. ශ්‍රී ලංකාවේ ඉහළ ම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්තයේ රාජාධිකරණය වෙත අභියාචනා කළ හැකි බළය අහෝසි කරණු ලැබුවේ

1. 1921 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
2. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
3. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්

35. පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් වන රටවල මහකොමසාරිස්

1. ආරක්ෂක ලේකම් ලෙස හඳුන්වයි
2. සභාපතිවරුන් ලෙස හඳුන්වයි
3. රාජ දූතයන් ලෙස හඳුන්වයි
4. කොන්සල් වරු ලෙස හඳුන්වයි

36. 1978 වර්ෂයේ දී පළාත් සභා පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ

1. දහ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ය
2. දොළොස් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව
3. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව
4. දාසය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ය

37. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ලොවට ඉදිරිපත් කරන ලද්දේ

1. ජොහාන් ගැල්ටුන් ය
2. ක්‍රිස් මිචෙල්ය
3. ලෙවිස් කෝෂර් ග
4. ජෝර්ජ් සිමෙල්ගේ

38. මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කිරීමේ එක් ආකාරයක් වනුයෙ පරිපාලන රටාව විමධ්‍යගත කිරීමයි. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති ආකාරය අනුව අනුපිළිවෙලින් දැක්වූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

1. ජාතික මට්ටම- දිස්ත්‍රික්ක මට්ටම -ප්‍රාදේශීය මට්ටම -ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම
2. දිස්ත්‍රික්ක මට්ටම -ජාතික මට්ටම -ප්‍රාදේශීය මට්ටම- ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම
3. ප්‍රාදේශීය මට්ටම- ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම -දිස්ත්‍රික්ක මට්ටම -ජාතික මට්ටම
4. ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම -ප්‍රාදේශීය මට්ටම -දිස්ත්‍රික්ක මට්ටමේ -ජාතික මට්ටම

39 සියලුම මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇත
ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති
යුක්තිය අයුක්තිය පිළිබඳ නැගීමෙන් හා හෘදය සාක්ෂියෙන් යුක්ත ඔවුන් ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්වය පිළිබඳ හැඟීමෙනි

ඉහත ප්‍රකාශය ඇතුළත් වනුයේ

1. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පළවෙනි වගන්තියෙ
2. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දෙවන වගන්තිය
3. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාවේ
4. 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයේ 13 වන වගන්තිය

40. A. දේශීය වශයෙන් නීතිය හා සාමය රැකීම
B. රජය සම්බන්ධ නඩුවලදී නීති උපදෙස් ලබා දීම
C. ජාතික වැදගත් අවස්ථාවල දී රජයට සහාය වීම
D. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුවත් කිරීම

ඉහත ප්‍රකාශයන්ගෙන් ආරක්ෂක හමුදාව මගින් සමාජ සුරක්ෂිතතාවය සඳහා ඉටු කරන කාර්යයන් වනුයෙ වනුයේ.

1. C. සහ. D.
2. A. සහ D.
3. A. සහ. C.
4. C. සහ. B

කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

පුරවැසි අධ්‍යාපනය

11 ශ්‍රේණිය

දෙවන පත්‍රය

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි
පළමුවන ප්‍රශ්නය අනිවාර්යවේ
පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

---

1. (1). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙළඳපල ආර්ථික ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න

(2). නිෂ්පාදිත භාණ්ඩ බෙදාහැරීමේ ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න

(3 ස්විට්සර්ලන්තයෙ ව්‍යවස්ථාදායකය වන සංඝීය මහා මණ්ඩලය සමන්විත වන ප්‍රධාන ආයතන දෙක නම් කරන්න

(4). එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යුහය ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න

(5). ජාතික රාජ්‍ය බිහිවීම කෙරෙහි බලපෑ හේතු දෙකක් නම් කරන්න

(6). ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරුවකු තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න

(7). වර්තමාන ශ්‍රී ලංකාවේ ඉහළම අභියාචනා අධිකරණ බලය සහිත ආයතනය සහ එහි ප්‍රධානියා නම් කරන්න

(8). පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තර මගින් ඉටු කළ යුතු යුතුකම් දෙකක් නම් කරන්න

(9). රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ දෙකක් නම් කරන්න

(10). සාර්ක් සාමාජික රටවල් අතර ඇති කරගෙන ඇති වෙළඳ ගිවිසුම් දෙකක් නම් කරත්ත

2. (1). ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන නිර්ණායක දෙකක් නම් කරන්න.

(2). ඡන්ද කොට්ඨාශ අනුව නියෝජිතයන් තෝරාගැනීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා අත්වන වාසි තුනක් නම් කර ඉන් එක් කරුණක් පැහැදිලි කරන්න.

3. (1). නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් 2කි .එය හඳුන්වන්න.

(2). නීති මූලාශ්‍ර තුනක් නම් කරන්න.

(3). නීතිය හා බැදුනු සංකල්පය හඳුන්වා එය කෙටියෙන් විග්‍රහ කරන්න.

4. (1). ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග දෙකක් නම් කරන්න.

(2). නගරාධිපති /සභාපති සතු බලතල හා කාර්‍යයන් තුනක් නම් කරන්න.

(3). පළාත් පාලන ආයතන මගින් සපයන සේවා තුනක් නම් කර ඉන් එක් සේවාවක් පිලිබඳව විස්තර කරන්න.

5. (1) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපා ඇති සංක්‍රමණික හේතු දෙකක් නම් කරන්න.

(2). සංස්කෘතියට අයත් අංග තුනක් නම් කරන්න.

(3). බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න

6. (1). අන්තර්ජාතික ගැටුම් බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

(2). ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාකච්ඡා ක්‍රමයෙහි දැකිය හැකි ලක්ෂණ තුනක් නම් කරන්න

(3) මැදිහත්කරුවකු සතු විය යුතු ගුණාංග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

7. (1). රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ දෙකක් නම් කරන්න

(2). සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන සම්ප්‍රදායික මිනුම් තුනක් නම් කරන්න

(3). සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරනු කරන නූතන මිනුම් තුනක් නම් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න

කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

---

# පුරවැසි අධ්‍යාපනය

## 11 ශ්‍රේණිය

**පළමු පත්‍රය**

**කාලය පැය එකයි**

**සැලකිය යුතුයි**

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

**අංක එකේ සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (*). ලකුණ යොදන්න**

---

1. රාජ්‍ය පාලන කටයුතුසඳහා සෘජුව හෝ වක්‍රව ජනතාවට සහභාගි වීමට දොරටු විවෘත වන පාලන ක්‍රමයක් ලෙස හැඳින්විය හැක්කේ,

   1. සමාජවාදී පාලන ක්‍රමය  2. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
   3. ගෝත්‍රවාදී පාලන ක්‍රමය  4. ධනවාදී පාලන ක්‍රමය

2. හයවන සියවසේ පෙරදිග රටවල් පාලන කටයුතු සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ අනුගමනය කළ බවට සාධක රට වනුයේ ඉන්දියාවයි. එම එම ජනපදය වනුයේ

   1. වජ්ජි ජනපදය  2. මගධ ජනපදය
   3. අංග ජනපදය  4. ලිච්ඡවී ජනපදය

3. පහත සඳහන් ප්‍රකාශ අතරින් මූලික අයිතිවාසිකම් යන සංකල්පය පැහැදිලි කෙරෙන ප්‍රකාශය කුමක්ද

   1. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සඳහන් සියලුම අයිතිවාසිකම්ය
   2. එක්සත් ජාතීන් විසින් පිළිගෙන ඇති වෛකල්පිත සම්මුති වල සඳහන් අයිතිවාසිකම්ය.
   3. මානව හිමිකම් අතුරින් තෝරාගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලට ඇතුළත් කර ඇති අයිතිවාසිකම් ය.
   4. බොහෝ රටවල් මානව හිමිකම් ප්‍රකාශනය ට අනුකූලව සකස් කරගත් අයිතිවාසිකම් ය

4. මිනිසාගෙ සියලු ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් අනුව ජීවිතය හැඩ ගස්වා ගැනීම හඳුන්වනු ලබන්නේ

   1. ජීවන රටාව ලෙසය  2. සංස්කෘතිය ලෙස
   3. ආචාර ධර්ම ලෙසය.  4. පෞරුෂත්වය ලෙසය

5. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් පුරවැසිය යුතුකමකි.

   1. පරිසර අලංකරණයට දායකවීම  2. පරිසර පිරිවැය තක්සේරු කිරීම

3. පරිසර නීති ක්‍රියාත්මක කිරීමය 4. පරිසරයට සංවේදීව කටයුතු කිරීම

6. ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ බලය හිමි අධිකරණය වන්නේ

1. ශ්‍රේෂ්ඨාධිකරණය 2. අභියාචනාධිකරණය
3. මහාධිකරණය 4. දිසා අධිකරණය

7. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු වැදගත් කාර්යය වන්නේ

1. ආණ්ඩු පක්ෂයේ යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහාය වීම
2. ආණ්ඩු පක්ෂයේ කාර්යයන් නිරන්තරයෙන් විවේචනයට භාජනය කිරීම
3. ආණ්ඩු පක්ෂය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාවලට විරුද්ධ වීම
4. ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන පලක් සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටීම

8. අතීතයේ සිට ශ්‍රී ලංකාව තුළ බලය විමධ්‍යගත කිරීම සිදු වී ඇත ඒ අනුව 'ගම්බාර' ' ගාමනි' වැනි නිලධාරීන් ගම් පාලනය සඳහා යොදවා ඇත්තේ

1. පොළොන්නරු යුගයේ දී ය 2. අනුරාධපුර යුගයේදී ය
3. බටහිර අධිරාජ්‍යවාදී පාලන කාලයේ 4. මහනුවර යුගයේදීය

9. අන්තර් භාණ්ඩ පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. පොහොර, ඛනිජ ,තෙල්, දැව. 2. හාල්පිටි, ඇඳුම් පැළඳුම්
3. පොහොර, ඛනිජ, තෙල් ,ඖෂධ 4. හාල් ,යන්ත්‍රසූත්‍ර, වාහන

10. වාර්ගිකත්වය පදනම් කරගෙන ඇති වූ ගැටුමකට උදාහරණයක් වන්නේ

1. ඊශ්‍රායල පලස්තීන ගැටුම 2. දකුණු අප්‍රිකානු වර්ණභේද ගැටුම
3. මැදපෙරදිග අර්බුදය 4. සෝමාලියාව හා ඉතියෝපියාව අතර ගැටුම

11. ඔම්බුඩ්ස්මන්කවරයාගෙන් අපෙක්ෂිත ප්‍රධාන කාර්යය කුමක්ද?

1. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගැටලු විසඳා ගැනීම
2. සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැළැක්වීම
3. සියලු පරිපාලකයන්ට සහායවීම
4. ජනාධිපති තුමාගේ කාර්ය මණ්ඩලයට සහාය වීම

12. ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක සංඛ්‍යාව

1. පහකි. 2. තුනකින්
3. හතරකි 4. දෙකකි

13. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අනුව ළමයෙකු සෙ සැලකෙන සීමාවන්නේ

1. අවුරුදු 12 ට අඩු 2. අවුරුදු 18
3. අවුරුදු 15ට අඩු 4. අවුරුදු 21 ට අඩු

14. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු බටහිර යුරෝපා රටවල සාමූහික ආරක්ෂාව සඳහා බිහිකරගත් සංවිධානය කුමක්ද?

1. ආසියානු සංවිධානය 2.නේටෝ සංවිධානය
3. සාර්ක් සංවිධානය 4. බිම්ස්ටෙක් සංවිධානය

15. රටක සංවර්ධනය මැනීමේ නූතන මිනුමක් වන්නේ

1. මූර්ත දළ ජාතික නිෂ්පාදිතය 2. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
3. භෞතික ජීවන තත්ව දර්ශකය 4. ආර්ථික සංවර්ධන වේගය

16. ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති දුරකථන අංකය කුමක්ද

1. 119 2. 1919
3. 19 29 4. 1939

17. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් සමඟ ශ්‍රී ලාංකිකයාට දේශපාලන කටයුතු වලට මැදිහත් වීමට වැඩි අවස්ථාවක් උදා වූයේ

1. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම නිසාය
2. ආණ්ඩුකාරධූරය ඇති කිරීම නිසාය
3. සර්වජන ඡන්ද බලය ලැබීම නිසාය.
4. පාර්ලිමේන්තුව පිහිටුවීම නිසාය

18. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රධානියා වන්නේ

1. නීතිපතිතුමා ය 2. අගවිනිසුරුතුමා ය
3. අධිකරණ අමාත්‍යතුමා 4. සොලිස්ටර් ජනරාල් තුමා ය

19. මානව සංවර්ධන දර්ශකයට අයත් නිර්ණායකය වන්නේ

1. ආයු අපේක්ෂාව සාක්ෂරතාවය හා ක්‍රය ශක්තිය මත ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
2. ආයු අපේක්ෂාව මාතෘ මරණ අනුපාතය හා සාක්ෂරතාව යයි
3. ළදරු මරණ අනුපාතිකය සාක්ෂරතාවය හා ආයු අපේක්ෂාවයි
4. ආයු අපේක්ෂාව දළ මරණ අනුපාතිකය හා ශක්තිය මත කලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය

20. සංවර්ධිත රටවල දක්නට ලැබෙන ඇතැම් ලක්ෂණ සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාවේ ද දක්නට ඇත. ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන එවැනි ලක්ෂණ දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න

1. ඉහළම මානව සංවර්ධන දර්ශකය හා අඩු ජනසංඛ්‍යා වර්ධනය
2. අධික නාගරික ජන සංඛ්‍යාව හා අඩු ළදරු මරණ අනුපාතිකය
3. ඉහළ ආයු අපේක්ෂාව හා ඉහළ සාක්ෂරතා මට්ටම
4. ඉහළ අධ්‍යාපනික වියදම හා අඩු මාතෘ මරණ අනුපාතය

21. තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී ඉටු කරගත යුතුය සමාජයේ අවශ්‍යතා දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න

A. .ලාභය උපරිම කර ගැනීමේ නිෂ්පාදන ආකල්ප පාලනය
B. වෙළෙඳපොළ පුළුල් වීම නිසා ඇතිවන තරඟය පාලනය
C. මූලික මිනිස් අවශ්‍යතා ඉටුකරගැනීම
D. පරිසර හිතකාමී සම්පත් පරිහරණය
E. සාධාරණත්වය ඉටුකර ගැනීම

1. A B. 2. B C. 3. C E. 4. D E

22. ඒකීය රාජ්‍යයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න

1. මහ බ්‍රිතාන්‍යය, ජපානය, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය
2. ජපානය, නේපාලය, ප්‍රංශය, ශ්‍රී ලංකාව
3. ඉන්දියාව, ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය
4. ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජපානය, ප්‍රංශය

23. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ගැටලුවක් වන්නේ

1. රාජ්‍යයක විවිධ පක්ෂ පැවැතීමයි
2. රාජ්‍යයක ජනගහනය අධික වීමයි
3. නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීමයි
4. පුරවැසියන්ගේ ආදායම් විෂමතාවය පැවැතීමයි

25. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණය වන්නේ

1. පාර්ලිමේන්තුවයි 2. විධායකයයි
3. ආණ්ඩුවයි. 4. අධිකරණයයි

26. පහත සඳහන් පිළිතුරු අතරින් ප්‍රජාතන්ත්‍රවාදයද ජන සමාජය තුළ ස්ථාපිත වීමට බලපාන ප්‍රධාන සාධක ලෙස සැලකිය හැක්කේ

1. රට තුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතිම.
2. දේශපාලන පක්ෂ රාශියක් රට තුළ ක්‍රියාත්මක වීම.
3. නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම.
4. දේශපාලන අවබෝධයකින් යුතුව ජනතාවක් සිටීම

27. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව පිහිටුවන ලද්දේ කුමන පනත මගින්ද?

1. 1996 අංක 21 දරණ පනත
2. 1998 අංක 50 දරන පනත
3. 1996 අංක 12 දරණ පනත
4. 1998 අංක 15 දරණ පනත

28 ශ්‍රී ලංකාවේ වැඩිම ප්‍රාදේශීය සභා සංඛ්‍යාවක් හිමිව ඇත්තේ

1. දකුණු පළාත- මාතර දිස්ත්‍රික්කය
2. උතුරුමැද - අනුරාධපුර දිස්ත්‍රික්කයට
3. වයඹ පළාත -කුරුණෑගල දිස්ත්‍රික්කය
4. වයඹ පළාත - පුත්තලම දිස්ත්‍රික්කයට ය

29. වෛද්‍ය ,ඉංජිනේරු, ගුරු ,සැලසුම් ශිල්පී යන රැකියා අවස්ථා වලින් කුමන විෂය ධාරාවක් හැදෑරුව ද ඇතුළත් විය හැකි රැකියාව වනුයේ

1. වෛද්‍ය 2. ඉංජිනේරු
3. සැලසුම් ශිල්පී 4. ගුරු

30. රාජ්‍යයක් සතු මූලික ලක්ෂණ නම්,

1. භූමිය ,ජනගහනය, අධිකරණය, ස්වාධීපති බලය
2. ආණ්ඩුව ,අධිකරණය ,විධායක ,ව්‍යවස්ථාදායක
3. භූමිය ,ජනගහනය, ආණ්ඩුව ,ස්වාධිපත්‍යය
4. ජනගහනය ,අධිකරණය ස්වාධිපත්‍යය, ආණ්ඩුව

31 ජනාධිපතිතුමා විසින් නම්කර පත් කරනු ලබන පළාත් සභා ධූරය කුමක්ද?

1. අගමැතිධූරය
2. ප්‍රධාන මහ ඇමැති ධූරය
3. අමාත්‍යධූරය
4. ආණ්ඩුකාරධූරය

32. යහපාලනය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් අඩංගු පිළිතුර තෝරන්න.

1. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තොරතුරු දැන ගැනීමට ජනතාවට අයිතියක් තිබිය යුතුය.
2. ආණ්ඩුවේ තීන්දු ගැනීම පිළිබඳව තොරතුරු දැනගැනීමට ජනතාවට අයිතියක් තිබිය යුතුය
3. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය හා තීන්දු පිළිබඳව තොරතුරු දැනගැනීමට ජනතාවට අයිතියක් තිබිය යුතුය
4. ඉහත එකක්වත් නොතිබිය යුතුය.

33. රාජ්‍යය නැමැති ආයතනය සැම විටම ක්‍රියාත්මක වන්නේ
   1. ස්ථාවර ආයතනයක් වශයෙනි
   2. වරින්වර වෙනස් වීම් වලට භාජනය වන ආයතනයක් වශයෙනි
   3. වෙනස්වීම් වලට භාජනය වෙමින් ස්ථාවරව පවතින ආයතනයක් වශයෙන්
   4. බාහිර බලවේග වලට නිරන්තරයෙන් භාජනය වන ආයතනයක් වශයෙනි

34. ශ්‍රී ලංකා මැතිවරණයකදී එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා තරග කරන අපේක්ෂකයින්ගෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයා ජයග්‍රාහකයා ලෙස පත්වන ක්‍රමය අප හඳුන්වන්නේ

   1. මහමැතිවරණය නමින්ය
   2. සමානුපාතික නියෝජන ක්‍රමය ලෙසය
   3. මහජන නියෝජිත ක්‍රමය ලෙසය
   4 සරල බහුතර නියෝජන ක්‍රමය ලෙසය

35. ශ්‍රී ලංකාවේ වැඩිම මහනගර සභා ප්‍රමාණය කට හිමිකම් කියන දිස්ත්‍රික්කය වන්නේ

   1. මොණරාගල
   2. කොළඹ
   2. වව්නියාව
   4. ගම්පහ

36. රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉටු කරනු ලබන්නේ

   1. ව්‍යවස්ථාදායකයයි.
   2. විධායකයයි
   3. පළාත් ආණ්ඩුවයි.
   4. අධිකරණයයි

37. ඒකීය රාජ්‍යයක් සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදිම ප්‍රකාශය වන්නේ

   1. අධිකරණ බලතල ප්‍රාදේශීය පාලන වෙත පවරා තිබීම
   2. ප්‍රාන්ත ආණ්ඩු නීති ලෙස නීතිය බෙදී පැවතීම
   3. බලතල බෙදී පැවතීම
   4. රාජ්‍ය ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රීය වීම.

38. සාක්ෂරතාවය ,උපතේදී  අපේක්ෂිත ආයු කාලය, ළදරු මරණ අනුපාතය යන සංරචකයන් හේතුවෙන් යුත් සංවර්ධනය මැන දැක්වීමේ මිනුම හඳුන්වනු ලබන්නෙ

1. මානව සංවර්ධන දර්ශකය
2. මූර්ත දළ ජාතික නිෂ්පාදනය
3. භෞතික ජීවන තත්ව දර්ශකය
4. දළ ජාතික නිෂ්පාදනය

39.

A ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම
B නවීන තාක්ෂණය බහුලව යොදා ගැනීම
C නවීන නිපැයුම් කෙරෙහි වේගවත් නැඹුරුතාවය
D. පාරිසරික තුලිතතාව රැකගත හැකි වීම

තිරසාර සංවර්ධනය යටතේ තාක්ෂණික ප්‍රතිලාභ ලෙස ඉහත ප්‍රකාශනයන්ගෙන් නිවැරදි වන්නේ

1. AසහB ය. 2. C සහ D. 3. AසහC. 4. A සහD

40. පහත ප්‍රකාශ කියවා සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතු වන ලක්ෂණ අඩංගු පිළිතුර තෝරා ලියන්න

1. පුරවැසියන්ට තම අදහස් සාමකාමීව ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම
2. සුළුතර අදහස් මර්දනය කිරීම
3. බහුතර මතයට පමණක් ගරු කිරීම
4. සාකච්ඡා මගින් තීරණවලට එළැඹීම

**පුරවැසි අධ්‍යාපනය**

**11 ශ්‍රේණිය**

**දෙවන පත්‍රය.**

**කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි**

**පළමුවන ප්‍රශ්නය අනිවාර්යවේ**

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න**

---

1. (1). යහපාලනයක මූලික අංග දෙකක් නම් කරන්න

(2). දේශපාලන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න

(3). නීති මූලාශ්‍ර දෙකක් නම් කරන්න

(4). ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න

(5) ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහයෙ ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න

(6). බහු සංස්කෘතික සමාජයක් බිහි වීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න

(7). රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ දෙකක් නම් කරන්න

(8). සංවර්ධනය වන රටවල් මුහුණපාන ගැටලු දෙකක් නම් කරන්න

(9) ස්වභාවික පරිසරයට අයත් සංසිද්ධීන් දෙකක් නම් කරන්න

(10). මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ දෙකක් දක්වන්න

2. (1). ආරවුල් බේරුම් කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න

(2). අධිකරණය ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග තුනක් නම් කරන්න

(3). අපක්ෂපාතීව සහ අප්‍රමාදව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවන අවාසි තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න

3. (1). ජාත්‍යන්තර සම්බන්ධතාව වර්ධනය වීමෙහිලා බලපාන සාධක දෙකක් නම් කරන්න

(2). කිසියම් රටක් ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු තුනක් ලියන්න.

(3). ජාත්‍යන්තර සම්බන්ධතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම බලපෑම කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න

4. (1). 1978 ජනපතිවරයා සතු ව්‍යවස්ථාදායක.බලතල 2ක් ලියන්න.

(2). 1978 ආණ්ඩු ක්‍රම වයවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකයට. තේරී පත්වන ආකාරය පහදන්න.

(3.) 1978 ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් 3ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.

5. (1). අභ්‍යන්තර ගැටුම් අයත් වන ප්‍රධාන අංග දෙක සඳහන් කරන්න

(2). ගැටුම් නිරාකරණයේ දී සාකච්ඡා ක්‍රමය මගින් ඇතිවන වාසි තුනක් පෙන්වා දෙන්න

(3). පන්ති කාමරය තුලදී සිදුවන විවිධ ගැටුම්කාරී අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ඔබ විසින් වර්ධනය කරගත යුතු ගුණාංග තුනක් දක්වන්න ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න

6. (1). ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේදි සුවිශේෂී අවධානය යොමු කරන ලද අංක දෙකක් නම් කරන්න

(2). ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් තුනක් නම් කරන්න

(3) පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් තුනක් නම් කර ඉන් එකක් තෝරාගෙන එම යුතුකම් ඉටුකිරීම පාසල් සමාජයේ යහපතට හේතු වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න

7. (1). ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.

(2). බලය විමධ්‍යගත කිරීමේදී මතුවන ගැටලු තුනක් නම් කරන්න

(3). පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලින් අත්වන ප්‍රයෝජන තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.